කාර්යාලය /அலுவலகம் / Office :
දුරකථන / தொலைபேசி / Telephone 0112034347
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112887422
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail agriculturemedia@gmail.com

# මාධ්‍ය ඒකකය
# ஊடகப் பிரிவு
# MEDIA UNT

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

මගේ අංකය / எமது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date **2025.09.01**

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ,

## කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 500ක සහන ණයක් ලබා දීමේ වැඩසටහනට කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය බැංකු සමඟ ගිවිසුම්ගත වෙයි.

කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 500ක සහන ණයක් ලබා දීමේ වැඩසටහන අදාළව කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකු සමඟ ගිවිසුම්ගත වීම අද (01) දින කෘෂිකර්ම අමාත්‍යාංශයේදී පැවැත්විණ.

මෙම අවස්ථාවට එක්වෙමින් කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ඩී.පී. වික්‍රමසිංහ මහතා සඳහන් කළේ මෙම වැඩසටහන තුළින් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ යම් පෙරළියක් සිදු කිරීමට අපේක්ෂා කරන බවයි. ව්‍යාසායකයාට ඊළඟ පියවර සඳහා යාමේදී මූල්‍ය ගැටළුවක් ඇති වේ නම් ඊට අවශ්‍ය මූල්‍ය සහය ලබා දීම මෙම ණය යෝජනා ක්‍රමය මඟින් සැපයිය හැකි බව ලේකම්තුමා මෙහිදී වැඩිදුරටත් සඳහන් කරන ලදී. මෙම සහන ණය යෝජනා ක්‍රමයේදී අය කරනු ලබන සියයට හතරක පොළිය පරිපාලන වියදම් සඳහා පමණක් අය කරන බවද ප්‍රකාශ කළේය.

ගිවිසුම් ගතවීමේ අවස්ථාවට සම්බන්ධ වූ කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ. ඩී. ලාල්කාන්ත මහතා අදහස් දැක්වීමේ අවස්ථාව කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න මහතා වෙත ලබා දුන්නේය.

"අපේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට වැඩසටහන් රාශියක් සැලසුම් කරලා තියෙනවා. අඩු භූමියකින් වැඩි ඵලදාවක් ලබා ගැනීමටත්, වසවිස භාවිතය අඩු ඵලදාවක් ලබා ගැනීමටත්, ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට හොඳ බීජ ලබා දීමටත්, පස පරීක්ෂා කරලා පසට ගැලපෙන විදිහට යෙදවුම් යෙදවීමටත් තාක්ෂණික ක්‍රම භාවිත කිරීමටත් අපි කටයුතු කරනවා. විශේෂයෙන් වාරි පද්ධතිය යථාවත් කිරීමේ කටයුතු ආරම්භ කරලා තියෙනවා. තාක්ෂණික දැනුම ගොවීන්ට ලබා දීමටත් අපි කටයුතු කරලා තියෙනවා.

විශේෂයෙන් තරුණ ව්‍යවසායකයින් කෘෂි ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීමට අදාළ මැදිහත්වීම් කරන්නත් අපි සැලසුම් කරලා තියෙනවා. ආවාහවිවාහ කටයුතුවලදී කිසිවකු තමන් ගොවියෙක් හොයනවා කියන කාරණය කියන්නේ නැහැ. අද තරුණයින් තමන් ගොවිතැන් කරනවා කියලා කියන්න ලැජ්ජයි. මේ මනෝභාවයන් බිඳ දැමිය යුතුයි. අපි Smart ගොවියෙක් නිර්මාණය කළ යුතුයි.

ගොවියා ව්‍යවසායකයෙක් බවට පත් කළ යුතුයි. කෘෂි ක්ෂේත්‍රය තුළ වැඩි වැඩියෙන් ආදායම් ලැබෙනවා නම්, හොඳ උත්තේජනයක් තියෙනවා නම් වෙළඳපොළ ප්‍රශ්නය ගැනත් අවබෝධයක් තියෙනවා නම් ව්‍යවසායකයෙක් විදිහට ඉහළට එන්න පුළුවන් කියන මතයත් එක්ක තරුණ පිරිස කෘෂිකර්මාන්තයට නැඹුරු වෙනවා.

ආරම්භයක් විදිහට මේ වැඩසටහනට රුපියල් මිලියන 500ක් වෙන් කරලා තියෙනවා. ඉතාමත් අඩු පොළියකට තරුණ කොටස් තෝරලා කෘෂි ක්ෂේත්‍රයට අදාළ විවිධ ව්‍යාපෘති ඔස්සේ මේ ණය පහසුකම් ලබා දෙනවා. මේ ණය පහසුකම ගත්තු කෙනා ව්‍යවසායකයෙකු විදිහට ඉදිරියට ගෙන එන එක තමයි අපගේ ඉලක්කය.”

අයදුම් පත්‍රය ගැසට් පත්‍රයක් මඟින් ඉදිරියේදී ප්‍රසිද්ධ කරන අතර පුවත්පත් සහ මාධ්‍ය වලින් ලබා ගත හැකි වේ. 4% ක් වැනි සුළු පොළියකට සහන ණය ලබා දී කෘෂිකර්ම ක්ෂේත්‍රය වඩා දියුණු තත්වයකට ගෙන ඒම රජයේ ප්‍රධානම අරමුණයි.

ලංකා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ආර්.එම්.එන්. ජීවන්ත මහතා, මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි එස්.එන්.බී.එම්.ඩබ්. නාරායන මහතා, ප්‍රදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරි ඩී.එම්.ටී.එස්. කුමාර මහතා ගිවිසුම් ගත වීමට සහභාගී විය.

මාධ්‍ය ඒකකය
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය